# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1808/4 - 2013 අප්‍රේල් මස 29 වැනි සඳුදා - 2013.04.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 451 වැනි අධිකාරය වූ වන සංරක්ෂණ ආඥාපනතේ 4(2) වැනි වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත 451 වැනි අධිකාරය වූ වන ආඥාපනතේ 4(2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය, සුසිල් ප්‍රේමජයන්ත, වන මම, වර්ෂ 2013ක් වූ ජනවාරි මස 18 දිනැතිව නිකුත් කරන ලද අංක 1793/21 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රක්ෂිත වනාන්තරයක් ලෙසට ප්‍රකාශයට පත් කරන ලද පදවිය රක්ෂිතයෙන් පහත උපලේඛනයේ හා එහි මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 12900ක් වූ කොටස 2013ක් වූ මැයි මස 25 වැනි දින සිට රක්ෂිත භාවයෙන් නිදහස් කරමි.

සුසිල් ප්‍රේමජයන්ත,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2013 අප්‍රේල් මස 26 වැනි දින,
බත්තරමුල්ල,
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව හා පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි හෙක්ටයාර් 12900ක වපසරියට අයත් රජයේ කැළෑ ඉඩම් ප්‍රදේශය වේ.

උතුරට : 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1) වගන්තිය යටතේ මහවැලි විශේෂ ව්‍යාපෘති බල ප්‍රදේශයක් ලෙස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1487/32 දරන 2007 මාර්තු මස 09 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයෙහි විශේෂ ප්‍රදේශ II යටතේ ප්‍රකාශයට පත් කරන ලද ව්‍යාපෘති බල ප්‍රදේශයේ බටහිර මායිම, උතුරු පළාත හා උතුරු මැද පළාත වෙන් කරනු ලබන මායිමෙහි උතුරු මායිම හමුවන ලක්ෂය වන ඛණ්ඩාංක

1A - PG 001613 — 435 (2013/04)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

නැගෙනහිරට 180449, උතුරට 406663 දැක්වෙන ලක්ෂයෙන් ආරම්භ වී එම ලක්ෂයේ සිට උතුරු පළාත හා උතුරු මැද පළාත වෙන් කෙරෙන මායිම ඔස්සේ නැගෙනහිර දිශාවට මාඔය ගංගාවේ මධ්‍ය ලක්ෂය හමුවන ලක්ෂය වන උතුරු පළාත නැගෙනහිර පළාත හා උතුරු මැද පළාත් මායිම් වෙන් කෙරෙන ලක්ෂය දක්වා ද,

නැගෙනහිරට : උතුරු මායිමේ අවසන් වරට සඳහන් කරන ලක්ෂයෙන් ආරම්භ වී මාඔයෙහි මධ්‍ය රේඛාව ඔස්සේ උඩුගං බලා පදවිය ජලාශයේ වැව් බැම්ම දිගේ දිවෙන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂය දක්වා දකුණු දිශාවට ද,

දකුණට : නැගෙනහිර මායිමේ අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයෙන් ආරම්භ වී පදවියේ සිට හම්මිල පොතන වැව දක්වා පදවිය ජලාශයේ වැව් බැම්ම මත දිවෙන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දෙසට ඛණ්ඩාංක නැගෙනහිරට 195469, උතුරට 400120 හමුවන ලක්ෂය දක්වා ද, එම ලක්ෂයේ සිට ඛණ්ඩාංක නැගෙනහිරට 193453 හා උතුරට 401229 දැක්වෙන ලක්ෂය දක්වා උතුරු දෙසට සරළ රේඛාවක් ඔස්සේ ද, එම ලක්ෂයෙහි සිට ඛණ්ඩාංක නැගෙනහිරට 192605 හා උතුරට 400765 දැක්වෙන ලක්ෂය දක්වා බටහිර දෙසට සරළ රේඛාවක් ඔස්සේ ද, එම ලක්ෂයෙහි සිට ඛණ්ඩාංක නැගෙනහිරට 191808 උතුරට 400617 දැක්වෙන ලක්ෂය දක්වා බටහිර දෙසට සරළ රේඛාවක් ඔස්සේ ද, එම ලක්ෂයේ සිට ඛණ්ඩාංක නැගෙනහිරට 190643 හා උතුරට 397259 දැක්වෙන ලක්ෂය දක්වා දකුණු දෙසට සරළ රේඛාවක් ඔස්සේ ද, එම ලක්ෂයෙහි සිට ඛණ්ඩාංක නැගෙනහිරට 186681 හා උතුරට 398597 දැක්වෙන ලක්ෂය වන උතුරු පළාත හා උතුරු මැද පළාත වෙන් කෙරෙන මායිම් හමුවන ලක්ෂය දක්වා බටහිරට සරළ රේඛාවක් ඔස්සේ ද,

බටහිරට : දකුණු මායිමේ අවසන් වරට සඳහන් කරනු ලැබූ ලක්ෂයෙන් ආරම්භ වී උතුරු පළාත් හා උතුරු මැද පළාත් වෙන් කෙරෙන මායිම ඔස්සේ මෙම උපලේඛනයේ උතුරු මායිම් ආරම්භක ලක්ෂය හමුවන ලක්ෂය දක්වා උතුරු දිසාවට ද වේ.

ප්‍රමාණය (හෙක්) : 12900

05 - 318

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.